COVID-19 එන්නත

# කරුණු ලබා ගන්න.

## මුහුණු ආවරණයක් පැළඳීම



## මුහුණු ආවරණයක් පැළඳීම හැමවිටම ආරක්ෂිත වේ

මහලු අය, වැඩිහිටියන්, යෞවනයන් සහ ළමුන් ඇතුළුව මිනිසුන් දහස් ගණනකට COVID-19 තවමත් ආසාදනය වේ. **ඔබේ ප්‍රදේශය තුළ මුහුණු ආවරණයක් පැළඳීම අවශ්‍ය වුවත් නැතත්, ඔබ මුහුණු ආවරණයක් පැළඳුවහොත් ඔබ සහ ඔබේ පවුල ආරක්ෂිත වනු ඇත.**

### මුහුණු ආවරණ COVID-19 න් ඔබව ආරක්ෂා කරයි

COVID-19 පහසුවෙන් ව්‍යාප්ත වන නිසා, මුහුණු ආවරණයක් පැළඳීමෙන් ඔබව, ඔබගේ පවුලේ අය, සහ ඔබේ ප්‍රජාව ආරක්ෂා කරයි.

- ✓ ඔබ මුහුණු ආවරණයක් පළඳින විට, වෛරසය වාතයේ ඇත්නම් ආශ්වාස කිරීමෙන් ඔබට රෝගී වීමට ඇති හැකියාව අඩු ය.
- ✓ COVID-19 රෝගය වැළ දී තිබුණ ද ඒ බව නොදැන සිටීමට හැකි ය, මන්ද සෑම කෙනෙකුම රෝගී බවක් නොදැනෙන බැවිනි. මෙවැනි තත්ත්වයක දී, මුහුණු ආවරණයක් පැළඳීමයි ඔබගෙන් අන් අයහට රෝගය ව්‍යාප්ත වීමට ඇති හැකියාව අඩු ය.

### එලදායී වීමට නම් මුහුණු ආවරණය නිසි ලෙස පැළඳිය යුතු ය.

- ඔබේ නාසය සහ කට වැසෙන පරිදි මුහුණු ආවරණය පළඳින්න
- ඉහළින් හෝ පැතිවලින් වාතය පිටතට නොයන බවට වග බලාගන්න
- මුහුණු ආවරණය පැළඳීම සහ ඉවත් කිරීම සිදු කළ යුත්තේ පිරිසිදු දෑත්වලිනි
- ඔබේ මුහුණේ තිබෙන විට මුහුණු ආවරණය ස්පර්ශ කිරීමෙන් වළකින්න
- නැවත නැවත භාවිතා කළ හැකි මුහුණු ආවරණය අඩු වශයෙන් දවසකට එක් වරක් වත් පිරිසිදු කරන්න
- භාවිතා කර බැහැර කළ යුතු මුහුණු ආවරණය එක් වරක් පමණක් භාවිතා කරන්න

### එන්නත් මගින් බෙහෙවින් ආරක්ෂාවක් ලබා දේ

- ඔබවම සහ ඔබේ ප්‍රජාව ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට ගත හැකි හොඳම පියවර වනුයේ එන්නත ලබා ගැනීමයි.
- සම්පූර්ණ එන්නත් මාත්‍රාවම ලබා ගත් පසුව COVID-19 රෝගය වැළඳීම හේතුවෙන් ඔබව රෝගී වීමට ඇත්තේ අඩු ඉඩකඩකි, ඔබ රෝගී වුව ද එන්නත ඔබව අනතුරුදායක ලෙස රෝගී වීමෙන් වළකයි.

### එන්නත් ලබා ගත් පුද්ගලයන් වුවද මුහුණු ආවරණ පැළඳීම ආරක්ෂිත වේ

එන්නත් ලබා ගත් පසුව පුද්ගලයන්හට COVID-19 හේතුවෙන් රෝගී වීම දුලබ කරුණකි, එසේ වුව ද එය සිදු විය හැකි ය.

රෝගී වීම සහ අන් අයහට COVID-19 ව්‍යාප්ත කිරීම වළක්වා ගැනීම සඳහා වන හොඳම ක්‍රම වන්නේ එන්නතක් ලබා ගැනීම සහ මුහුණු ආවරණයක් පැළඳීමයි.

NRC-RIM
National Resource Center for Refugees, Immigrants, and Migrants

වැඩි විස්තර සඳහා: cdc.gov/coronavirus